අංගොඩ ලොක්කා යන අන්වර්ථ නාමයෙන් හැඳින්වෙන ලසන්ත පෙරේරා නම් ශ්‍රී ලංකා පොලිසියට අත්අඩංගුවට ගැනීමට අවශ්‍ය සැකකරුවෙකු මියගිය බවට වන ප්‍රචාරය පිළිබඳව අද දිනයේ (23) පුවත්පත් තුළ පුවත් වාර්තාවන් පළව ඇති ආකාරය පහතින් දැක්වේ.

මෙහිදී මව්බිම, සිලෝන් ටුඩේ, ලංකාදීප සහ දිවයින යන පුවත්පත් ඔස්සේ දැක්වී තිබුණේ මෙම අංගොඩ ලොක්කා නමින් හැඳින්වෙන අය ඝාතනය කොට ඇති බව තහවුරු වූ පුවතක් ලෙසිනි. කෙසේ වෙතත් අරුණ, දිනමිණ සහ ඩේලි මිරර් යන පුවත්පත් මෙය වාර්තා කොට තිබුණේ තවමත් තහවුරු නොවූ, ප්‍රශ්නාර්ථයක් සහිත පුවතක් ලෙසිනි.

එසේම එම සැකකරුට වස දී ඇති යැයි පැවසෙන කාන්තාව ඔහුගේ "අනියම් බිරිඳ" යැයි දිවයින පුවත් වාර්තාව සඳහන් කොට ඇත. අනෙකුත් පුවත්පත් ඇය පිළිබඳව සඳහන් කරන්නේ අංගොඩ ලොක්කා හා වාසය කළ මුල්ලේරියාවේ රත්තරන්ගේ බිරිඳ/ඔහු හා සමීපව කටයුතු කළ කාන්තාවක්/ ඔහුගේ පෙම්වතිය ලෙස සිටි කාන්තාවක්/ බිරිඳ/ කාන්තාවක් යනාදී වශයෙනි.

මිරිහාන පොලිස් ස්ථානයේ පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවකට එක් වූ පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ජාලිය සේනාරත්න සඳහන් කළේ, මෙම සැකකරු මියගිය බවට රාවයක් පැවතියද, ඒ සම්බන්ධයෙන් නීත්‍යානුකූලව තහවුරු කළ තොරතුරු මෙතෙක් පොලිසියට වාර්තා වී නොමැති බවයි.

තත්වය මෙසේ නම්, පුවත්පත් කිහිපයක් මගින් මෙම ප්‍රචාරයක් ලෙසින් පවත්නා සිදුවීම නිශ්චිතව සිදුවූවක් ලෙසින් ඉදිරිපත් කොට ඇත්තේ මන්ද?
මෙම කරුණු කාරණා සම්බන්ධයෙන් පාඨක ඔබේ අදහස කුමක්ද?

(පොලිස් මාධ්‍ය ප්‍රකාශකගේ ප්‍රකාශය
මෙතැනින්: https://www.youtube.com/watch?feature=emb_title&time_continue=1&v=UvIzPRhfcMM&app=desktop

#MediaEthicsSL #lka #SinhalaPress #EnglishPress #News #Mawbima #Aruna #Dinamina #Lankadeepa #CeylonToday #DailyMirror